## පළමුවන කියැවීම

ඉසයියස් 53:10-11

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"ඔබ දීර්ඝායු ලැබ ජීවත් වන්නාහ."**

එහෙත් එතුමන් පෙළනු ලැබුවේත්, දුකට පත් කරණු ලැබුවේත් සමිඳුණන්ගේ කැමැත්ත ලෙසය. මෙසේ එතුමන්ගේ මරණය පව් කමා කරන පූජාවක් වේ. එබැවින් එතුමෝ සිය පරපුර දැක දීර්ඝායු ලැබ ජීවත් වන්නාහ. එතුමන් මගින් සමිඳුන්ගේ කැමැත්ත මැනවින් සඵල වේ. එතුමන් සිය දුක් වේදනාවේ ප්‍රතිඵල දැක, තෘප්තියට පැමිණෙනු ඇත. බොහෝ දෙනාගේ පව් තමන් පිට ගැනීමෙන්, එතුමන් ලත් දුක් වේදනාවෙන් දේව සබඳතාවයට ඔවුන් පත් කරනු ලබනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 33:4-5, 18-20, 22

පිළිතුර: **සමිඳුන්ගේ කරුණාව අප කෙරෙහි වේවා!**

ගීය: සමිඳුන්ගේ වචනය අවංක ය. එතුමන්ගේ ක්‍රියා සියල්ලක් ම විශ්වාසශීලී ය. දැහැමි බව හා යුක්තිය එතුමන්ට ප්‍රිය ය. මහ පොළොව හිමි තුමන්ගේ කරුණාවෙන් පිරී ඇත.

දේව භය ඇත්තෙනි, දේව කරුණාව පතන්න, මරණයෙන් ගළවන පිණිසද දුබික් දුරු කොට දිවි රක්නා පිණිස ද එතුමාණෝ දිවැසින් බලන සේක.

අපි හිමි තුමන් කෙරේ විශ්වාසයෙන් සිටියෙමු. අපේ පිහිටත්, පළිහත් එතුමාණෝ ය. සමිඳුනි, ඔබ කෙරේ අපේ බලාරොත්තු පිහිටෙවූ ලෙස ම ඔබේ කරුණාව අප කෙරෙහි වේවා!

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 4:14-16

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද හසුනෙන් ගත් කොටසකි.

**" ඇදහිලෙන් කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු."**

එබැවින් අහස් මඩල ඉක්මවා ගිය දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වන ජේසුස් නම් ශ්‍රේෂ්ඨ උත්තම පූජකයකු අපට සිටින නිසා, අපේ ඇදහිල්ලෙහි නොසෙල් වී පවතිමු. මන්ද, අපට ඇත්තේ අපේ දුබලකම් ගැන අනුකම්පාවක් නැති උත්තම පූජකයකු නොව, හැම අයුරින් ම වාගේ පරීක්ෂාවලට මුහුණ පෑ පාප රහිත උත්තම පූජකයෙකි. එබැවින් ඕනෑකම්වලදී අපේ සරණ සඳහා දයානුකම්පාව ලබන පිණිස බිය සැක නැතිව කරුණාවේ සිංහාසනය වෙත ළඟා වෙමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ජුවාම් 14:6

ආලේලූයා! ආලේලූයා!
"මාර්ගය ද, සත්‍යය ද, ජීවනය ද, මම වෙමි.
මා මගින් මිස කිසිවෙක් පියාණන් වහන්සේ වෙත නොපැමිණෙන්නේ ය"යි
ස්වාමින් වහන්සේ වදාරන සේක
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** මාක් 10:35-45

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මනුෂ්‍ය-පුත්‍රයාණන් වැඩියේ බොහෝ දෙනාගේ මිදීම පිණිස සිය දිවි පිදීමට ය."**

සෙබදීගේ පුත් ජාකොබ් ද ජුවාම් ද ජේසුස් වහන්සේ වෙත අවුත්, "ගුරුදේවයෙනි, අප ඉල්ලන දේ ඔබ අපට ඉටුකර දෙන සේක නම් අපි කැමැත්තෙමු"යි කී හ. "මා ඔබට කුමක් කර දෙනවාට ඔබ කැමැත්තෙහු දැ"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. "ඔබගේ තේජශ්‍රීයෙහි දී, අපෙන් එක් කෙනෙකුට ඔබගේ දකුණු පස ද, එක් කෙනෙකුට වම් පස ද හිඳගන්නට වරම් දුන් මැනවැ"යි ඔව්හු උන් වහන්සේට කී හ. එහෙත් ජේසුස් වහන්සේ, "ඔබ ඉල්ලන්නේ කුමක් දැ යි ඔබ ම නොදන්නහු ය. මා බොන දුක් වේදනා නමැති කුසලානෙන් බොන්න හෝ මා ලබන බෞතිස්ම-ස්නාපනය ලබන්නට හෝ ඔබට හැකි දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. "අපට හැකිය"යි ඔව්හු උන් වහන්සේට කී හ. ජේසුස් වහන්සේ ද, "මා බොන කුසලානෙන් ඔබත් බොනු ඇත මා ලබන බෞතිස්ම-ස්නාපනයෙන් ඔබත් බෞතිස්ම-ස්නාපනය ලබනු ඇත. එහෙත්, මාගේ දකුණු පස ද වම් පස ද ඉඳගන්න දීම මා සතු දෙයක් නොවේ. යම් අය සඳහා එය නියම කර ඇද්ද, එය අයිතිවන්නේ ඔවුන්ට ය"යි වදාළ සේක. එවිට අනික් දස දෙනා ඒ අසා ජාකොබ් සහ ජුවාම් සමඟ අතිශයින් කෝප වූ හ. ජේසුස් වහන්සේ ඔවුන් තමන් වෙතට කැඳවා මෙසේ වදාළ සේක: "විජාතීන් අතර ආණ්ඩුකාරයන් වශයෙන් සම්මත වූවන් ඔවුන් කෙරේ ආධිපත්‍යය පවත්වන බවත්, ඔවුන්ගේ ප්‍රධානීන් ඔවුන් කෙරෙහි බලය පාන බවත් ඔබ දන්නහු ය. එහෙත්, ඔබ අතර එසේ නොවේ. ඔබ අතර ප්‍රධානියා වන්න කැමති යමෙක් ඇද්ද, ඔහු ඔබේ සේවකයා විය යුතු ය. ඔබ අතර ස්වාමියා වන්න කැමති යමෙක් ඇද්ද, ඔහු සියල්ලන්ගේ දාසයා විය යුතු ය. කුමක් හෙයින් ද මනුෂ්‍ය-පුත්‍රයාණන් වුව ද වැඩියේ, සේවය ලැබීමට නොව සේවය කිරීමට ය; බොහෝ දෙනාගේ මිදීම පිණිස සිය දිවි පිදීමට ය."

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.